# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## ඌව පළාත

### බදුලු දිස්ත්‍රික් නඩුශාලාවේදීය

පස්සර කෝරළේ පැල්ගහතැන්නේ ඇත්තෝරගහ වත්තේ කලු ආරච්චිගේ බුද්ධදාස පෙරේරා ........................ පැමිණිලිකාරයා.

නොම්මරය : 3287. එදිරිව

දෙබැද්දේ පැල්ගහතැන්නේ ඉලුක් වත්තේ ගෙදර හේරත් මුදියන්සේලාගේ කිරිවන්තේ ........................විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන්, වර්ෂ 1966 ක්වූ මැයි මස 27 දින පෙ. ව. 10.30ට එම ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම්: රුපියල් 2,700 ක් අයකර ගැනීම පිණිස:

ඌව පළාතේ බදුලු දිස්ත්‍රික්කයේ යටිකිඳ පස්සර කෝරළේ පැල්ගහතැන්නේ බටහිර මැදවෙල ගම පිහිටි, උඩු කුඹුර (දැනට ගොඩ බිම) වී දෙපැලක පමණ වපසරියට මායිම්:—උතුරට මෙම කුඹුරේ ඇළ නැගෙණහිරට මහා පාර දකුණට මෙම කුඹුරේ ඉතිරි කොටසේ ඉම බස්නාහිරට හීන් අප්පුගේ කුඹුරේ ඉම යන මෙහි තුළ ඉඩම සහ ඊට අයිති සෑම සියලු දේත් වේ.

විල්ප්‍රඩ් ඇ. සෙනරත්,
ඌව පළාතේ අතිරේක නියෝජ්‍ය පිස්කල්.

1966 අප්‍රේල් 16 වැනි දින.
බදුලු පිස්කල් කන්තෝරුවේ දී ය.

4-181

---

### බදුල්ලේ ඉල්ලීම් නඩුශාලාවේදීය

දැනට උඩපළාත කෝරළේ අඹේවෙල රජයේ ගොවිපළේ පදිංචි කල්ලරාවේගෙදර විජේකෝන් මුදියන්සෙලාගේ ධර්මදාස ........................................................................පැමිණිලිකාරයා.

නොම්මරය : 3950 එදිරිව

නැසීගිය ණයකරු-ඇස්. ඇම්. අප්පුහාමිගේ දේපල වලට නීත්‍යානුකූල බලකාරයා වන, දැනට පරණගම උමාඇල ගල්වත්තේ ගෙදර පදිංචි-ඇස්. ඇම්. කලුබණ්ඩා..........................විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966ක්වූ මැයි මස 23 දින පෙ. ව. 11.30ට ඉඩම පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. රුපියල් 632 කට 1963.5.18 සිට 1965.3.26 වැනි දින දක්වා අවුරුද්දකට (15%) සියයට පහළොව ගණනේ ද, එතැන් සිට එම සම්පූර්ණ මුදලට මුළු මුදල ගෙවන දින දක්වා නියමිත නීති පොළියද, නඩු ගාස්තුව වශයෙන් රුපියල් 84ක් අයකර ගැනීම පිණිසයි. විකුණන දිනට අය විය යුතු මුදල රුපියල් 822.65.

ඌව පළාතේ බදුලු දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ යටිපළාත කෝරළයේ දවුල්දෙනගම පිහිටා ඇති උතුරට-ගම්සභා පාරෙන් ද, නැගෙනහිරට-පුංචිරාලට අයිති ඉඩමේ පැලඉනි වැටෙන් ද, දකුණට-ඇලෙන් සහ බස්නාහිරට-කුඩා පාරකින් ද මායිම් වූ අක්කරයක් පමණ ඉඩම ඇති "දෙඩංගහආරාවේවත්ත" නමැති ඉඩමේ බිමෙන් හා එහි ඇති පලතුරු සහිත සියලුම වැවිලි වලින් නොබෙදු දෙකෙන් කොටසක් වේ. මෙම ඉඩම අංක සී 268/68 යටතේ ලියා පදිංචි කර ඇත.

විල්ප්‍රඩ් ඒ. සෙනරත්,
ඌවේ අතිරේක නියෝජ්‍ය පිස්කල්.

1966 අප්‍රේල් 17 වැනි දින,
බදුල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

4-911

